**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**
**නීතිවේදී (ගෞරව) උපාධි පරීක්ෂණය**

**දෙවන වසර - පළමු සෙමෙස්තරය - 2025**

**LAW 21301-අපරාධ නීතිය II**
(පැය 2 මිනිත්තු 15)

මුළු ප්‍රශ්න ගණන: 04

**ඕනෑම ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න**
(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ)

---

1. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ විධිවිධාන ඇසුරින් පහත සඳහන් සිදුවීම් සම්බන්ධයෙන් පෙරේරා විසින් සිදු කර ඇති අපරාධමය වැරදි සාකච්ඡා කරන්න:

   අ) පෙරේරා විසින් සිල්වාගේ මුහුණට ප්‍රචණ්ඩ ලෙස පහර දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සිල්වාගේ වම් කම්මුල ඉදිමී රත් පැහැ වූ අතර ඔහුගේ යටි තොලෙහි සුළු කැපුමක් ඇති විය.

   ආ) පෙරේරා යකඩ පොල්ලකින් සන්නද්ධව ආරුමුගම්ගේ කකුල් සහ පිටට කිහිප වතාවක් පහර දුන්නේය. ප්‍රහාරයෙන් පසු, ආරුමුගම් හට දැඩි ශාරීරික වේදනාවක් ඇති වූ අතර ආධාර නොමැතිව ඇවිදීමට නොහැකි විය. වේදනාව සහ තුවාල හේතුවෙන්, ආරුමුගම් එක්තැන් වී ඇඳට සීමා වූ අතර දින 25 ක් වඩු කාර්මිකයෙකු ලෙස ඔහුගේ දෛනික වැඩ කිරීමට නොහැකි වූ බව වෛද්‍ය වාර්තාවකින් තහවුරු විය.

   ඇ) කුලිය නොගෙවීම සම්බන්ධයෙන් ඇති වූ ආරවුලකින් පසු පෙරේරා, මීගමුව ප්‍රදේශයේ පෞද්ගලික නේවාසිකාගාරයක කාමරයක් තුල මනීෂාව සිර කළේය. අසල්වැසියන් මැදිහත් වන තුරුම මනීෂා හට පැය දෙකකට ආසන්න කාලයක් කාමරයෙන් පිටව යාමට අවසර නොලැබුණි.

   ඈ) ගැටුමක් අතරතුර පෙරේරා විසින් අත මිට මොළවා අක්‍රම් හට "මම උඹගේ මුහුණ තලනවා" යනුවෙන් තර්ජනය කළේය. තමාට පහර දීමට ආසන්න බව විශ්වාස කළ අක්‍රම් තමා හට ඉක්මනින් ශාරීරික හානියක් සිදු වේ යැයි කලබලයට හා බියට පත් විය.

   ඉ) පෙරේරා විසින් හිතාමතාම ඔහුගේ සුනඛයා වූ 'රෙක්ස්' යොදාගනිමින් කුමාරිව බියට පත් කිරීම සඳහා ඇයගේ දැනුවත්කමින් තොරව ඇය වෙතට රෙක්ස් පැනීමට පොළඹවන ලදී. මෙම අනපේක්ෂිත සිදුවීමෙන් කුමාරි කලබලයට පත් වූ අතර 'රෙක්ස්' ගේ හදිසි හා ආක්‍රමණශීලී හැසිරීමෙන් ඇය තර්ජනයට ලක් විය.

**(5 X 6 = ලකුණු 30)**

2. (අ) හා (ආ) යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න:

(අ) 18 හැවිරිදි තරුණයෙකු වන සකුණ, 15 හැවිරිදි ගැහැණු ළමයෙකු වන චේතනා සමඟ ප්‍රේම සම්බන්ධතාවයක පැටලී සිටියේය. මෙම සම්බන්ධතාවය අතරතුර ඔවුන් දෙදෙනා අවස්ථා කිහිපයකදී කැමැත්තෙන් ලිංගික සංසර්ගයේ නිරත වූහ. මෙය දැනගත් පසු චේතනාගේ දෙමාපියන් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළ අතර වයස අවුරුදු 18 ට අඩු කාන්තාවක් දූෂණය කිරීම සම්බන්ධයෙන් සකුන අත්අඩංගුවට පත් විය. පොලිස් විමර්ශනය අතරතුර, චේතනා ප්‍රකාශ කළේ ලිංගික ක්‍රියාවන් සිදු වූයේ ඇගේ සම්පූර්ණ කැමැත්ත ඇතිව බවයි.

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානවලට අනුව සකුණ විසින් සිදු කරන ලද වැරදි සාකච්ඡා කර අදාළ නඩු නීතිය සමඟ ඔබේ පිළිතුර ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

(ආ) සන්දීප් සහ ප්‍රදීප් සමලිංගික සම්බන්ධතාවයක යෙදී සිටි අතර වාහන නවත්වන පොදු ස්ථානයක දී සන්දීප්ගේ මෝටර් රථය තුළ ඔවුන් සිප ගනිමින් සිටිනු දක්නට ලැබුණි. ඔවුන් වාහනයේ සිටියදී, පොලිසිය විසින් ඔවුන් දෙදෙනා ළඟට පැමිණ, පුද්ගලයන් අතර දැඩි අශෝභන ක්‍රියාවන් සිදු කිරීම යන පදනම මත අත්අඩංගුවට ගන්නා ලදී.ඔවුන්ගේ පෞද්ගලික අවකාශයට හෝ පෞද්ගලික ජීවිතයට ඇඟිලි ගැසීමට පොලිසියට බලයක් නොමැති බවට තර්ක කරමින් සන්දීප් හා ප්‍රදීප්, ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට විරුද්ධ විය.

සන්දීප් සහ ප්‍රදීප් විසින් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ කිසියම් වරදක් සිදු කළ ඇත්ද? ඔබේ පිළිතුර අදාළ නඩු තීන්දු නිතිය සමග ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 30)

3. රංග, කොළඹ පිහිටි ප්‍රසිද්ධ ස්වර්ණාභරණ වෙළඳසැලක් වන ලක්ෂ්මි මහල් හි කළමනාකරු වේ. වෙළඳසැලේ ආරක්ෂිත සෙප්පුවේ (vault) යතුරු ඔහු සතුව පැවති අතර සියලුම දෛනික මූල්‍ය වාර්තා වෙත ඔහුට ප්‍රවේශය තිබුණි.වෙළඳසැලෙහි හිමිකරු වන පෙරේරා පසුගිය මාස තුන තුළ රන් මාල තොගයේ නොගැලපීම් කිහිපයක් දුටුවේය. එය පිළිබඳ විමසීමේදී, රංග කියා සිටියේ සමහර මාල අලුත්වැඩියා කිරීම සඳහා යවා ඇති බවත් අනෙක් ඒවා විකුණා ඇති බවයි. නමුත් ඒ සම්බන්ධව කිසිදු රිසිට්පතක් ලබා දීමට ඔහු අපොහොසත් විය. රංග ඔහුගේ මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු මාස කිහිපයකින් රන් මාල ආපසු ලබා දෙන අදහසින් ඒ වෙනුවට රන් අලෙපිත ව්‍යාජ රන්මාල ආරක්ෂිත සෙප්පුවේ තබා රහසිගතව නියම රන් මාල එයින් ඉවත් කර ඔහුගේ පුද්ගලික ජාතික හැඳුනුම්පත

භාවිතා කරමින් දේශීය උකස් තැරැව්කරුවෙකු වන ඩිලාන් හට ඒවා උකස් කරන ලදී. කෙසේ වෙතත්, ඔහු කිසි විටෙකත් මෙම ක්‍රියාවන් පිළිබඳව පෙරේරා හට දැනුම් දුන්නේ නැත.

දිනක් වෙළඳසැල වසා දමමින් සිටියදී, සීසීටීවී (CCTV) පද්ධතිය ක්‍රියා විරහිත වී ඇති බව රංග දුටුවේය. එයින් ප්‍රයෝජන ගනිමින්, ඔහු, ඔහුගේ මිතුරා වන සංජීව සමඟ සෙල්ලම් පිස්තෝලයක් සහ මුහුණු ආවරණ සහිතව සන්නද්ධව සිටිමින් පෙරේරා හට ක්ෂණික මරණ බියක් ඇති කරමින් අදාළ වෙළඳසැලට පැමිණ රුපියල් මිලියන 5 ක් වටිනා මුදල් සහ ආභරණ පැහැර ගත්තේය. ඉන්පසු, පෙරේරා සිහිසුන්ව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතරතුර රංග ව්‍යාජ පොලිස් පැමිණිල්ලක් ගොනු කරමින් කියා සිටියේ තමාව ද එම අවස්ථාවේ වෙළඳසැලේ රඳවාගෙන සිටි බවත් සොරුන් විසින් තමාටද පහර දුන් බවත්ය.

සති දෙකකට පසු, පොලිසිය දුරකථන වාර්තා හරහා අපරාධය අනාවරණය කරගත් අතර සංජීවගේ නිවසින් ආභරණවලින් කොටසක් සොයා ගත්තේය. එසේම තවදුරටත් අනාවරණයේ වූයේ ඩිලාන් අදාළ රන් මාල වල මූලාශ්‍රය සත්‍යාපනය නොකර රංග වෙතින් රන් මාල කිහිපයක් ලබාගෙන ඇති බවත්, පසුව ඒවායින් සමහරක් තමන්ට හිමි බව පවසමින් තෙවන පාර්ශවයකට නැවත විකුණා ඇති බවත් ය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ රංග, සංජීව සහ ඩිලාන් විසින් සිදු කරන ලද වැරදි සාකච්ඡා කරන්න.ඔබගේ පිළිතුර අදාළ නඩු නීතිය සමග ඉදිරිපත් කරන්න.

(ලකුණු 30)

4. "අපරාධ නීතිය මිනිස් සිරුරේ පාරිශුද්ධභාවය සහ දේපළවල ආරක්ෂාව යන දෙකම ආරක්ෂා කිරීමට උත්සාහ කරයි. පුද්ගලයාගේ ශරීරයට එරෙහි වැරදි සහ දේපළවලට එරෙහි වැරදි අතර සීමාවන් සැමවිටම දැඩි නොවන අතර, බොහෝ විට එකී හානි ද්විත්වයම එකවර සිදු කරන අවස්ථා තිබේ."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහි ද? ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ විධිවිධාන සැලකිල්ලට ගනිමින් සාකච්ඡා කරන්න. එවැනි වැරදිවලට පාදක වන නීතිමය මූලධර්ම වෙත අවධානය යොමු කරමින් විනිශ්චිත නඩු තීන්දු සහ ඔබේම උදාහරණ පිළිඹිබු වන අයුරින් ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

(ලකුණු 30)

****